**කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර.**

**දෙවන වාර ඇගයීම - 2018**

**පුරවැසි අධ්‍යාපනය I-II**

**8 ශ්‍රේණිය**

**කාලය පැය 02**

**සැලකිය යුතුයි.**

**(i) I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**(ii) II කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය බැවින් එම ප්‍රශ්නය ඇතුළත්ව තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු ලියන්න.**

I කොටස

ප්‍රශ්නවලට ගැලපෙන වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. පොදු සේවා සැපයීමේ ප්‍රධාන අරමුණක් ලෙස සඳහන් කළ හැකි වන්නේ,
   1. ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනයයි.
   2. රජය විසින් ජනතාව වෙත ඉටු කළ යුතු සුබ සාධන කාර්යයක් ලෙසයි.
   3. රජයේ ආදායම ඉහළ දමා ගැනීමයි.
   4. ජනතාවගේ සහාය රජය වෙත ලබා ගැනීමයි.

2. සහනදායි පදනමක් මත ජනතාවට සපයන පොදු සේවාව කුමක්ද?
   1. විදුලිය 2. අධ්‍යාපනය 3. ප්‍රවාහනය 4. පණිවිඩ හුවමාරුව

3. අනුරාධපුර යුගයේදී මහජන සෞඛ්‍ය නංවාලීම වෙනුවෙන් පොදු සේවා රැසක් සලසා දුන් රාජ්‍ය පාලකයෙකු ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ,
   1. බුද්ධදාස රජතුමාය 2. දුටුගැමුණු රජතුමාය.
   3. දෙවන පෑ තිස් රජතුමාය 4. ධාතුසේන රජතුමාය.

4. පොදු සේවාවක් ලෙස ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවාවෙන් ඉටුවන මූලික කාර්යය නම්,
   1. රෝග නිවාරණය හා රෝග සුව කිරීම තුළින් සෞඛ්‍යවත් ජනතාවක් බිහි කිරීම.
   2. වසංගත රෝග මැඩලීම.
   3. ජනතාවට පෝෂ්‍යදායි ආහාරපාන සැපයීම.
   4. වෛද්‍යවරු වැඩි ප්‍රමාණයක් බිහි කිරීම.

5. ප්‍රජාතාන්ත්‍රික ජන සමාජයක හඳුනා ගත හැකි ලක්ෂණයක් වන්නේ,
   1. තනිව තීරණවලට එළඹීම.
   2. අදහස් හා මත පළ කිරීමේ නිදහස සීමාවීම.
   3. වෙනත් සංස්කෘතීන් නොසලකා හැරීම.
   4. සාකච්ඡාවෙන් සාමූහික තීරණවලට එළඹීම.

6. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව පුද්ගලයෙක් ළමයෙකු ලෙස පිළිගන්නා වයස් සීමාව වනුයේ,
   1. අවු. 18ට අඩු 2. අවුරුදු 16 ට අඩු
   3. අවුරුදු 21 ට අඩු 4. අවුරුදු 15 ට අඩු

7. චිත්තවේග පාලනය කර නොගැනීමෙන් ඇතිවන ප්‍රතිඵලයක් වනුයේ
   1. පසුතැවීමය 2. අරමුණ ඉටු කර ගත හැකි වීම.
   3. සමාජයේ ප්‍රශංසාවට ලක් වීම. 4. දෛනික කටයුතු සාර්ථකව සිදුවීම.

8. විදුලිය පරිහරණයේදී නොකළ යුතු දෙයක් වනුයේ,
   1. විදුලිය හැකිතාක් ප්‍රයෝජනයට ගැනීම.
   2. අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම.
   3. කලට වේලාවට බිල්පත් ගෙවීම.
   4. විදුලියට සම්බන්ධ උපකරණ මැනවින් නඩත්තු කිරීම.

9. ගොවිජනතාව වෙත සේවා සපයන සමූපකාර සමිති හඳුන්වන්නේ,
   1. නිවාස සමූපකාර සමිති
   2. කෘෂිකාර්මික සමූපකාර සමිති
   3. ණය දෙන සමූපකාර සමිති
   4. විවිධ සේවා සමූපකාර සමිති.

10. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක වෙසෙන පුරවැසියෙකු ලෙස ඔබ සතු විය යුතු ගුණාංගයක් වනුයේ පහත කරුණුවලින් කවරක්ද?
   1. ආත්මාර්ථකාමී බව
   2. සමානාත්මතාව
   3. පක්ෂපාතී බව
   4. තරඟකාරීබව

11. අයහපත් චිත්තවේග සමනය කර ගැනීම සඳහා වඩාත් උචිත ක්‍රියාමාර්ගයක් වනුයේ,
   1. අන්තර්ජාලයේ සැරිසැරීම
   2. පරිසරය රස විදීම.
   3. රූපවාහිනි නාට්‍ය බැලීම.
   4. අනුන්ට විහිළු තහළු කිරීම.

12. නායකයා සතු විය යුතු මූලික ගුණාංගයක් ලෙස සැලකෙනුයේ,
   1. මෙහෙයවීම හා පෙළඹවීම.
   2. දොස් පැවරීම හා විධාන දීම.
   3. අරමුණ වෙත එළඹීමට දැඩි නීති පැනවීම.
   4. දක්ෂයන්ගෙන් පමණක් කාර්ය ඉටු කර ගැනීම.

13. බහු සංස්කෘතික සමාජයක් පවතින රටක හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,
   1. විවිධ ජාතීන් ජීවත් වීම.
   2. එකම ජාතියක් පමණක් ජීවත් වීම.
   3. ජනවර්ග අතර සමානතා පැවතීම.
   4. ජනවර්ග අතර අන්තර් සබඳතා නොපැවතීම.

14. මිනිසාට මුහුණ පෑමට සිදුව ඇති ස්වාභාවික විපත් යටතට ගැනෙන කරුණක් වන්නේ,
   1. රිය අනතුරු හා ජීවිත හානි
   2. අනවසර ඉදිකිරීම් නිසා වන ජල ගැලීම්
   3. ගංවතුර හා නියඟය
   4. ඩෙංගු උවදුර

15. අනතුරු හා ආපදා සම්බන්ධව කටයුතු කරන ආයතනයක් වන්නේ,
   1. විදුලි බල මණ්ඩලය
   2. මාර්ග ප්‍රවාහන අධිකාරිය
   3. ගිනි නිවන ඒකකය
   4. පාරිභෝගික අධිකාරිය.

16. ප්‍රවාහන අවශ්‍යතා ඉටු කර ගැනිමේදී භාවිතයට ගත හැකි පරිසර හිතකාමී වාහනයක් ලෙස සැලකෙන්නේ,
   1. යතුරු පැදිය
   2. මෝටර් රථය
   3. පා පැදිය
   4. ත්‍රිරෝද රථය

17. තිරසාර සංවර්ධනයේදී වඩාත් සැලකිලිමත් වන කරුණක් වනුයේ,
   1. පරිසරය රැක ගැනීම හා සම්පත් අරපරිස්සමෙන් භාවිතා කිරීම.
   2. නිෂ්පාදනය වේගවත් කිරීම හා සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම.
   3. තරඟකාරීව නිෂ්පාදන කටයුතු වල නිරත වීම හා ලාභ ලැබීම.
   4. පරිසරය ආරක්ෂාවන අයුරින් නිෂ්පාදන කටයුතු සිදු කිරීම.

18. පරිසර හිතකාමී පුරවැසියෙකු වශයෙන් කටයුතු කිරීමේදි නොකළ යුතු ක්‍රියාවක් වන්නේ,
   1. පරිසර ආචාර ධර්ම පිළිපැදිම.
   2. පරිසරයෙන් ලැබෙන දෑ පරිභෝජනය කිරීම හා පරිසරය වෙනුවෙන් යුතුකම් ඉටු නොකිරීම.
   3. පරිසර නීති පිළිපැදිම.
   4. පරිසරය පණ මෙන් ආරක්ෂා කිරීම.

19. ප්‍රජාතන්ත්‍රවාදී සමාජ පාලන ක්‍රමයක් පවතින රටවල හඳුනා ගත හැකි මූලික ලක්ෂණයක් වනුයේ ,
   1. නිදහස් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය
   2. එක් දේශපාලන පක්ෂයක් පමණක් පැවැතීම
   3. ජනතාවගේ අයිතිවාසිකම් කෙරෙහි සැලකිල්ලක් නොදැක්වීම
   4. මාධ්‍ය නිදහස නොපැවතීම

20. නායයාමට ලක්වන ප්‍රදේශ වැඩි ප්‍රමාණයක් පිහිටා ඇති දිස්ත්‍රික්කයක් වනුයේ ,
   1. හම්බන්තොට
   2. යාපනය
   3. මොනරාගල
   4. කළුතර

**II** කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

1. i. පොදු සේවා යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?
   ii. මහජනතාව වෙත සපයන ආකාරය අනුව පොදු සේවා වර්ග කළ හැකි ආකාර 2 ක් ලියන්න.
   iii. රජය ජනතාව වෙත නොමිලේ ලබා දෙන පොදු සේවාවන් 2 ක් නම් කරන්න.
   iv. සමුපකාරයේ ආදර්ශ පාඨය ලියා දක්වන්න.
   v. පරිසර සංරක්ෂණය වෙනුවෙන් රජය පිහිටුවා ඇති ආයතන 2 ක් ලියන්න.
   vi. පාසල තුළ හඳුනා ගත හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 2 ක් ලියන්න.
   vii. බහු සංස්කෘතික සමාජ පවතින රටවල් 2 ක් නම් කරන්න.
   viii. අයහපත් චිත්තවේග 2 ක් නම් කරන්න.
   xi. ස්වාභාවික විපත් අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 2 ක් ලියන්න.
   x. රසායනික ද්‍රව්‍ය මගින් වන අනතුරු වළක්වා ගැනිමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 2 ක් සඳහන් කරන්න.

(ලකුණු 2x10= 20)

02. i. පොදු සේවාවන් සැපයීම වෙනුවෙන් කටයුතු කරන ආයතන 2 ක් නම් කරන්න. (ලකුණු 02)
   ii. පොදු සේවාවලට පොදු වූ ලක්ෂණ 3 ක් දක්වන්න. (ලකුණු 03)
   iii. පොදු සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් විසින් ඉටු කළ යුතු යුතුකම් 3 ක් දක්වා ඉන් එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03. i. පරිසර සංරක්ෂණය යනු කුමක්ද? (ලකුණු 02)
   ii. පොදු සේවා සපයන ආයතන සේවා ලාභීන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් 3 ක් ලියන්න.

(ලකුණු 03)

iii. පොදු සේවාවක් ලෙස ජලය ප්‍රයෝජනයට ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 3 ක් දක්වා එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 05)

04. i. යහපත් චිත්තවේග යනු කුමක්ද? (ලකුණු 02)
   ii. එවැනි චිත්තවේග තත්ත්වයන් 3 ක් නම් කරන්න. (ලකුණු 03)
   iii. අයහපත් චිත්තවේග තමන්ට මෙන්ම අනුන්ටද හානිදායක වන අයුරු පෙන්වා දීමට කරුණු 03 ක් දක්වා එක් කරුණක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. i. සංස්කෘතික අනන්‍යතාවය යනු කුමක්ද? (ලකුණු 02)

ii. ජාතික සමගිය හා තිරසාර සාමය ගොඩ නගා ගැනිමට හේතුවන කරුණු 3 ක් ලියන්න.

(ලකුණු 03)

iii. ජාතික සමගිය හා තිරසාර සාමය ගොඩ නගා ගැනිමේ වාසි 3 ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

06. i. ස්වාභාවික විපත් යනු කුමක්ද? (ලකුණු 02)

ii. ස්වාභාවික විපත් ඇති කිරීමට බලපාන හේතු 3 ක් දක්වන්න. (ලකුණු 03)

iii. මාර්ග අනතුරු සිදු විමට බලපාන මූලික හේතු 3 ක් දක්වා එක් හේතුවක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

07. i. රසායනික ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ අනතුරු සිදුවන ක්ෂේත්‍ර 2 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. රසායනික ද්‍රව්‍ය අනතුරු වලක්වා ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 3 ක් ලියන්න. (ලකුණු 03)

iii. තිරසාර සංවර්ධනය යනු කුමක්දැයි හදුන්වා එහිදී සැලකිලිමත් වන කරුණු 3 ක් සඳහන් කරන්න.

(ලකුණු 05)

08. i. මූලික මිනිස් අවශ්‍යතා 2 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. දැරිය හැකි සරල ජීවන රටාවකට හා පරිභෝජන රටාවකට හුරුවීමෙන් පුද්ගලයාට ලැබෙන ප්‍රයෝජන 3 ක් ලියන්න. (ලකුණු 03)

iii. පරිසරය සුරැකීම වෙනුවෙන් ඔබට කළ හැකි ක්‍රියාකාරකම් 3 දක්වා කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 05)